මතුගම අධ්‍යාපන කලාපය Matugama Education Zone மத்துகம கல்விக் வலயம் මතුගම අධ්‍යාපන කලාපය Matugama Education Zone மத்துகம கல்விக் வலயம் මතුගම අධ්‍යාපන කලාපය

# මතුගම අධ්‍යාපන කලාපය

## දෙවන වාර ඇගයීම් වැඩසටහන - 2020

| ඉතිහාසය | 9 ශ්‍රේණිය | කාලය : පැය 02 යි |
|---|---|---|

ශිෂ්‍යයාගේ නම :- ..............................................................................................

## I පත්‍රය

- ❖ **සියළුම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න**
- ❖ **01 සිට 20 දක්වා වූ ප්‍රශ්න සඳහා වඩාත් නිවැරදි පිළිතුර යටින් ඉරක් අඳින්න**

01 17 වන සියවසේ මෙරට මුහුදුබඩ ප්‍රදේශ වල බලය තහවුරු කරගත් ලන්දේසි ජාතිකයන්ගේ මව් රට වූයේ,

1 එංගලන්තය 2 ඕලන්දය 3 පෘතුගාලය 4 ස්පාඤ්ඤය

02 කලන් අල්බස් නම් ලන්දේසි දූතයා මෙරටට පැමිනෙන විට උඩරට රජු වන්නේ,

1 පළමුවන විමලධර්මසූරිය රජු 2 පළමුවන රාජසිංහ රජු 3 දෙවන විමලධර්මසූරිය රජු 4 දෙවන රාජසිංහ රජු

03 සේනාංක 06 ක් මාර්ග හයක් ඔස්සේ උඩරට රාජධානිය ආක්‍රමණය කළ ලන්දේසි ආණ්ඩුකාරයා වූයේ,

1 ජෙරාඩ් හල්ෆ්ට් 2 කොර්නේලියස් ටැකල් 3 ජොරිස් වෑන් ස්පිල්බර්ජන් 4 බැරන් වෑන් එක්

04 කොළඹ කොටුවට පහරදී පෘතුගීසීන් මෙරටින් එළවා දැමීමට අවසන් සටන මෙහෙය වූ ලන්දේසි සෙන්පතියා වන්නේ,

1 ජෙරාඩ් හල්ෆ්ට් 2 කොර්නේලියස් ටැකල් 3 ජොරිස් වෑන් ස්පිල්බර්ජන් 4 කලන් අල්බස්

05 ආසියාවේ ලන්දේසි පාලන ප්‍රදේශ පිළිබඳව තීරණ ගත් ඉහළම මණ්ඩලය වූයේ,

1 ඕලන්දයේ VOC සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලය 2 ශ්‍රී ලංකාවේ ලන්දේසි ආණ්ඩුකාරවරයා

3 බතාවියේ ලන්දේසි ආණ්ඩුකාරවරයා 4 බතාවියානු වෙළෙඳ සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලය

06 පළමුවන විමලධර්මසූරිය රජුගෙන් ඇරඹි උඩරට රාජ පරම්පරාවේ අවසාන රජු කවුරුන්ද ?

1 ශ්‍රී වීර පරාක්‍රම නරේන්ද්‍රසිංහ රජු 2 ශ්‍රී විජය රාජසිංහ රජු 3 දෙවන විමලධර්මසූරිය රජු 4 දෙවන රාජසිංහ රජු

07 හූෆ්ට් අද්මිනිස්තාර් ප්‍රධානියා වූ ලන්දේසි අධිකරණය වූයේ

1 ලෑන් රාද් 2 සිවිල් රාද් 3 රාද් වෑන් ජස්ටිට් 4 පිස්කල් උසාවි

08 මෙරට මුහුදුබඩ ප්‍රදේශවල ලන්දේසි පාලනය මුළුමනින්ම අවසන් වූයේ ?

1 ක්‍රි. ව. 1505 2 ක්‍රි. ව. 1766 3 ක්‍රි. ව. 1795 4 ක්‍රි. ව. 1796

09 බ්‍රිතාන්‍යයන් මෙරට පාලනය කල වසර ගනන වන්නේ

1 වසර 133 කි 2 වසර 150 කි 3 වසර 144 කි 4 වසර 103 කි

10 ඉංග්‍රිසි වෙළඳ සමාගම පැනවූ බදු වර්ගයක් නොවූයේ

1 තුවක්කු බද්ද 2 පොල් ගස් බද්ද 3 ලුණු බද්ද 4 මාළු බද්ද

11. ක්‍රිඃ වඃ 1815 උඩරට ගිවිසුමෙන් බුද්ධ ශාසනය හා දේවාගම් ද භික්ෂූන් වහන්සේලා ද ආරක්ෂා කරන බව පොරොන්දු වුයේ කුමන වගන්තියෙන්ද ?

1 පළමු වගන්තියෙන් 2 තෙවන වගන්තියෙන් 3 සිව්වන වගන්තියෙන් 4 පස්වන වගන්තියෙන්

12 ක්‍රිඃ වඃ 1848 නිදහස් සටනේ නායකයෙකු නොවන්නේ ?

1 ඩිංගිරාල 2 බූටෑවේ රටේ රාල 3 ගොංගාලේගොඩ බණ්ඩා 4 පුරන් අප්පු

13 ක්‍රිඃ වඃ 1911 දී සමූපාකාර සමිති ව්‍යාපාරය ආරම්භ කරන ලද්දේ පහත සඳහන් කුමන ආණ්ඩුකාරයා විසින් ද ?

1 විලියම් ග්‍රෙගරි 2 හෙන්රි මැකලම් 3 හෙන්රි වෝඩ් 4 හර්කියුලිස් රොබින්සන්

14 මෙරට ඉස්ලාම් පුනරුදයට නායකත්වය සපයන ලද්දේ කවුරුන්ද ?
1 එම්. සී. සිද්ධිලෙබ්බේ 2 ආරුමුග නාවලර් තුමා
3 ඔරාබි පාෂා 4 ටී. බී. ජයා

15 වර්ෂ 1898 දී තරුණ බෞද්ධ සංගමය පිහිටුවීමෙහිලා පුරෝගාමී වූ පුද්ගලයා වන්නේ,

1 අනගාරික ධර්මපාල තුමා 2 බ්‍රහ්මචාරි වලිසිංහ හරිස්චන්ද්‍ර මැතිතුමා ය.
3 සර් ඩී.බී. ජයතිලක මැතිතුමා ය. 4 පියදාස සිරිසේන මැතිතුමා ය.

16 ඉන්දියානු නිදහස් සටන් ව්‍යාපාරයේ සටන්කාමී නායකයෙකු නොවූයේ
1 ලාල් ලජ්පත් රායි 2 දදාබායි නඖරෝජි
3 බාල් ගංගාධාර් තිලක් 4 බිපින් චන්ද්‍රපාල්

17 ඉන්දියානු සාගර කලාපයේ පෘතුගීසි බලය ව්‍යාප්ත කිරීමට විශාල සේවයක් කළ පෘතුගීසි ප්‍රතිරාජයා කවුරුන්ද ?

1 පීටර්සන් කූන් 2 අපොන්සෝ ද අල්බුකර්ක්
3 ප්‍රැන්සිස්කු ද අල්මේදා 4 ලොරන්සෝ ද අල්මේදා

18 19 වන සියවසේදී හින්දු සමාජය තුළ ආගමික හා සංස්කෘතික ප්‍රබෝධයක් ඇතිකිරීමට බලපෑ බ්‍රහ්ම සමාජය ආරම්භ කරන ලද්දේ කවුරුන්ද ?
1 රාම් මෝහන් රෝයි 2 බහදූර් ෂා
3 මහත්මා ගාන්ධි 4 බිපින් චන්ද්‍රපාල්

19 "ස්වරාජ්‍ය යනු මාගේ ජන්ම උරුමයකි මම එය ලබා ගනිමි" යනුවෙන් ප්‍රකාශ කළේ
1 ජවහර්ලාල් නේරු 2 සී. ආර්. දාස්
3 මහත්මා ගාන්ධි 4 බිපින් චන්ද්‍රපාල්

20 මුස්ලිම් ජනතාවගේ අයිතිවාසිකම් වෙනුවෙන් මුස්ලිම් ලීගය පිහිටුවීමට නායකත්වය ගන්නා ලද්දේ කවුරුන්ද ?
1 මවුලානා අබුල් කලාම් අසාද් 2 බහදූර් ෂා
3 අගාකාන් 4 මොහොමඩ් අලි ජින්නා

(ලකුණු 2×20 - 40 )

# II පත්‍රය

- ✸ **පළමුවන ප්‍රශ්නය අනිවාර්ය වේ**
- ✸ **අනිකුත් ප්‍රශ්න අතුරින් හතරකට පිළිතුරු සැපයිය යුතුය**
- ✸ **පිළිතුරු සැපයිය යුතු මුළු ප්‍රශ්න සංඛ්‍යාව 5 කි**

01 පහත A සහ B යටතේ දක්වා ඇති පින්තූ ර අධ්‍යයනය කොට අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු අංක අනුපිළිවෙන් ඔබේ පිළිතුරු පත්‍රයේ ලියන්න



(අ)i A පින්තූරයන් දැක්වෙන්නේ කවුරුන්ද?

ii මොහු කුමන රාජධානි සමයකට අයත් ද ? A

iii මෙතුමාගේ කාලයේ මෙරටට මුහුදුබඩ ප්‍රදේශවල බලය තහවුරු කරගත් යුරෝපා ජාතිය නම් කරන්න ?

iv මෙතුමාට එරෙහිව පෘතුගීසීන් එල්ල කළ ආක්‍රමණයක් දක්වන්න



(ආ) i B පින්තූරයන් දැක්වෙන්නේ කවුරුන් ද?

ii මෙම හිමියන් ආරම්භ කළ පිරිවෙනක් දක්වන්න

iii උන්වහන්සේ රචනා කළ ග්‍රන්ථයක් දක්වන්න B

iv උන්වහන්සේ අධ්‍යාපනය හැදෑරුවේ කුමන හිමියන් යටතේ ද ?

(ලකුණු 2 × 8 = 16 )

02 i 1638 ගිවිසුමේ ප්‍රධාන කරුණු දෙකක් දක්වන්න ( ලකුණු 02 )

ii මෙරට ලන්දේසි ආණ්ඩුකාරයාට සහ ඔහුගේ උපදේශක සභාවට පැවරී තිබූ බලතල තුනක් සඳහන් කරන්න ( ලකුණු 04 )

iii ලන්දේසීන් උපරිම ආර්ථික වාසි ලබා ගැනීමට අනුගමනය කල ක්‍රියාමාර්ග තුනක් කෙටියෙන් දක්වන්න ( ලකුණු 05 )

03 i තෝම්බු යනු මොනවාද ? ( ලකුණු 02 )

ii පහත සඳහන් උඩරට රජවරුන් මුණගැසුණු ලන්දේසි දූතයන් නම්කරන්න

A දෙවන විමලධර්මසූරිය රජු
B ශ්‍රී වීරපරාක්‍රම නරේන්ද්‍රසිංහ රජු ( ලකුණු 04 )

iii ලන්දේසි පාලනය නිසා මෙරට සමාජයේ සිදුවූ සමාජ සංස්කෘතික බලපෑම් තුනක් කෙටියෙන් දක්වන්න ( ලකුණු 05 )

04 i බ්‍රිතාන්‍යයන්ගේ මෙරට මුහුදුබඩ ප්‍රදේශවල පාලනයේ කැපීපෙනෙන අවස්ථා තුන නම්කරන්න ( ලකුණු 03 )

ii 1797 මෙරට මුහුදුබඩ ප්‍රදේශ වල ඇතිවූ විරෝධතා අරගලය සඳහා බලපෑ හේතු දෙකක් නම්කරන්න ( ලකුණු 04 )

iii 1815 වන විට උඩරට පැවති සමගිය බිඳවැටීමට බලපෑ හේතු තුනක් කෙටියෙන් දක්වන්න ( ලකුණු 05 )

05 i ද්විත්ව පාලනය යනු කුමක්ද ? ( ලකුණු 02 )

ii 1818 නිදහස් සටන අසාර්ථක වීමට බලපෑ හේතු දෙකක් නම්කරන්න ( ලකුණු 04 )

iii 1848 නිදහස් අරගලයට බලපෑ ප්‍රධාන හේතු දෙකක් කෙටියෙන් දක්වන්න ( ලකුණු 05 )

06 i මිෂනාරීන් සිය ආගම ප්‍රචාරය කිරීමට යොදාගත් මුද්‍රිත ප්‍රකාශන දෙකක් දක්වන්න? ( ලකුණු 02 )

ii A - පරම විඥානාර්ථ සමාගම යටතේ ආරම්භ වූ පාසල් දෙකක් දක්වන්න

B - ධර්මපාලතුමාගෙනි සිදු වූ සේවාවන් දෙකක් දක්වන්නක (ලකුණු 04 )

iii 1848 නිදහස් සටනේ ප්‍රතිඵල කෙටියෙන් පැහැදිලි කරන්න ( ලකුණු 05 )

07 i සිපොයි කැරැල්ල යනු කුමක්ද ? ( ලකුණු 02 )

ii ඉන්දියානුවන් තුළ දේශානුරාගය වර්ධනය වීමට බලපෑ හේතු 02 දක්වන්න ( ලකුණු 04 )

iii මහත්මා ගාන්ධිතුමා ඉන්දියාවට නිදහස දිනාගැනීමට ගෙන ගිය ව්‍යාපාර 04 ක් සඳහන් කර ඉන් එකක් කෙටියෙන් දක්වන්න

( ලකුණු 05 )